# නැගෙනහිර පළාතේ ගොවීන් අතර ජනප්‍රිය රටකජු හා බඩඉරිඟු භෝග

**ශ්‍රී** ලංකාවේ නැගෙනහිර පළාත, බොහෝ දෙනෙකුගේ මෑත කාලීන කතා-බහට ලක් වූ ප්‍රදේශයක් වශයෙන් හැඳින්විය හැකිය. කුරිරු එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් ගෙන් එම පළාත සම්පූර්ණයෙන්ම මුදවා ගැනීමෙන් අනතුරුව, මේ වනවිට සීඝ්‍රයෙන් සංවර්ධනය වෙමින් තිබේ. මෙම ප්‍රදේශය තුළ කර්මාන්ත අංශයේ මෙන්ම සේවා අංශයේ දියුණුව සඳහා රජය යටිතල පහසුකම් පුළුල් කරමින් සිටින අතරම සාම්ප්‍රදායික ජීවනෝපායයන් නැංවීම කෙරෙහි ද අවධානය යොමු කොට ඇත. මෙම නැගෙනහිර උදනය නො එසේනම් යළි පිබිදීමත් සමඟ අම්පාර දිස්ත්‍රික්කයට විවිධ පාර්ශවයන්ගේ විශේෂ අවධානය යොමු වන්නේ නිකැතිනි. ඊට සමාජ-ආර්ථික මෙන්ම ඓතිහාසික හේතු සාධක රැසක් පවතී.

ශ්‍රී ලංකාවේ ගොවි ජනපද ව්‍යාපාරයට පදනම වැටුනේ මෙම ප්‍රදේශයෙනි. ඌව වෙල්ලස්ස හා දිගාමඩුල්ල ප්‍රදේශයේ කුඹුරු සහ වගා බිම් පෝෂණය කරමින් ගලන සුප්‍රසිද්ධ ජල කඳ හඳුන්වන්නේ **"ගල්ඔය"** යනුවෙනි. මෙය කි.මී. 112 (සැ. 70)ක් පමණ අම්පාර දිස්ත්‍රික්කය ඔස්සේ දිගු දුරක් ගෙවමින් පැමිණ නැගෙනහිර පළාතේ කල්මුනේ ප්‍රදේශයෙන් මහ සාගරය සමඟ එකතු වේ. කෙසේ වෙතත්, ගල්ඔය නිම්නයේ පහළ ප්‍රදේශ වලට වග කිව යුත්තන්ගේ අවධානය යොමු වීමත් සමඟ අම්පාර ජලාශය (Ampara Tank) බිහිවීම පෙන්වා දිය හැකිය. තව ද, බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ ගල්ඔය හරස් කොට වැලි බැම් හා අමුණු (Sand dams and Permanent anicut) ස්ථාපිත කොට නිම්නයට සමීප වැව් සහ අමුණු පුරවා ගල්ඔයට පහළ ප්‍රදේශයන් හි වගා කටයුතු වලට ජලය සපයා දී තිබුණි. නිදසුනක් ලෙස කොන්ඩවටවාන වැව සහ අම්පාර ජලාශය දැක්විය හැකිය. මෙමඟින් කුඹුරු අක්කර දහස් ගණනක් වගා කෙරෙයි. ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය කෙරෙන දිස්ත්‍රික්කයන් අතර සුවිශේෂී වී නිෂ්පාදන ප්‍රදේශයක් ලෙස අම්පාර දිස්ත්‍රික්කය හැඳින්විය හැකිය.

වී නිෂ්පාදනයට අමතරව අම්පාර දිස්ත්‍රික්කයේ **ගොවීන් අතර ජනප්‍රිය වගාවන් දෙකක් වන්නේ රටකජු සහ බඩඉරිඟු වගාවයි.** ඒ පිළිබඳ විස්තර හා උපදෙස් පිපාසාවකින් පසුවෙන ගොවීන් නිරන්තර කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් ආයතන සහ කාර්යාලවලට පැමිණ තොරතුරු විමසයි. එපමණක් නොව, කෘමිනාශක අලෙවි කරන වෙළඳුන් ගෙන් පවා වගා උපදෙස් අපේක්ෂා කරන බැව් අපගේ ක්ෂේත්‍ර සංචාරයන්හි දී අනාවරණය විය.

එබැවින්, අම්පාර දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ **නිමල් දයාරත්න** මහතාගේ සහයෝගය සහ මග පෙන්වීම අනුව අපි එකී කාර්යාලයේ සේවයේ නියුතු විෂයානුබද්ධ නිලධාරී **එච්.ඒ. අමරසේන වික්‍රමසිංහ** මහතාගෙන් රටකජු සහ බඩ ඉරිඟු වගා කිරීම පිණිස වන වගා උපදෙස් විමසා සිටියෙමු. මේ සමඟ පළවන ලිපි යුගල ඒ මහතා විසින් **"ගොවි ජනතා"** සඟරාව වෙනුවෙන් විශේෂයෙන් සකස් කළ බැව් ස්තුති පූර්වකව සඳහන් කළ යුතුය.

- **සංස්කාරක** -

# රටකජු වගාව

උද්භිද නාමය - ඇරකිස්හයිපොජියා

කුලය - ලෙගියුමිනේසියේ

රටකජු වගාව යල-මහ දෙකන්නයේම ජල සම්පාදනය හා වර්ෂාපතනයෙන් වගා කළ හැකි භෝගයකි. අහස් දියෙන් හේන් වගාව යටතේ වගා කරන භෝගයක් ලෙස සැලකිය හැකිය. රටකජු භෝගය තනි වගාවක් ලෙස හා මිශ්‍ර වගාවක් ලෙසත්, අතුරු වගාවක් ලෙසත් වගා කළ හැකිය.

**පාංශු අවශ්‍යතාවයන්**

හොඳින් ජලය වහනය වන ph අගය 5.5-6.5 දක්වා වූ පරාසයක වැලි, ලෝම පස මේ සඳහා ඉතා යෝග්‍යය. රතු දුඹුරු පසේ ද රටකජු වගාව හොඳින් කළ හැකිය. තද පස් වර්ගවල අස්වනු නෙළීමට කම්කරු වියදම වැඩිවන අතර අස්වනු අඩුවීම ද සිදු විය හැකිය.

**බිම් සැකසීම**

සෙ.මී. 25-30ක් පමණ හොඳින් ගැඹුරට සී සෑම කර කැට පොඩි කර සියුම්ව බිම් සකස් කර ගත යුතුය. මෙය රටකජු භෝගයේ හොඳින් වර්ධනය වූ මූල මණ්ඩලයක් සඳහා ඉතා වැදගත් වේ. වැටි හා කාණු ක්‍රමයට බිම් සකස් කිරීම ඉතා යෝග්‍යය.

| නිර්දේශිත ප්‍රභේද | වයස (දින) | අස්වැන්න හෙ/කි.ග්‍රෑ. |
|---|---|---|
| එම්.අයි. 1 | 110-115 | 2,800 |
| නොම්බර 45 | 110-115 | 3,000 |
| රෙඩ්ස්පැනිස් | 110-115 | 2,400 |
| උගන්ඩා ඉරෙක්ට් | 110-115 | 2,000 |
| තිස්ස | 90-100 | 2,250 |
| වලවේ | 120-135 | 3,400 |

**බීජ අවශ්‍යතාවය**

* පොතු රහිත හෙ. 1 ට කි.ග්‍රෑ. 70

* පොතු සහිත හෙ. 1 ට කි.ග්‍රෑ. 100

**සිටුවන කාලය**

* **යල කන්නය** - අප්‍රේල් මාසය තුළ බීජ සිටුවීම කළ යුතුය.

* **මහ කන්නය** - ඔක්තෝබර් මස මැද සිට අවසානය දක්වා බීජ සිටුවීම කළ යුතුය.

බීජ සිටුවන විට පසේ තෙතමනය තිබීම ඉතා වැදගත් වේ.

**බීජ සිටුවන පරතරය**

සෙ.මී. 45×15 එක තැනක එක් බීජයක් සිටුවීම කළ යුතුය.



**මූලික පොහොර යෙදීම**

යූරියා කි.ග්‍රෑ. 45 හෙක්. 01 කට,

සුපර් පොස්පේට් කි.ග්‍රෑ. 140 හෙක්. 01 කට,

මියුරියේට් ඔෆ් පොටෑෂ් කි.ග්‍රෑ. 75 හෙක්. 01 කට ආදී වශයෙනි.

**මතුපිට පොහොර යෙදීම**

වගාවෙන් 50%ක් පමණ මල් පිපෙන විට යූරියා කි.ග්‍රෑ. 30ක් යොදා පස් එකතු කිරීම කළ යුතුය. මෙම පස් එකතු කිරීමේ දී ඡායාංගධර වලට හානි නොවන පරිදි සිදු කළ යුතුය.

**ජල සම්පාදනය**

රටකජු වගාවේ මුළු ජල අවශ්‍යතාවය හෙක්. 01කට සෙ.මී. 90 කි. පළමු සති 03 දී දින 4කට වරක් ජලය සැපයීම සිදු කොට ඉන් පසු දින 7කට වරක් ජලය සැපයීම කළ යුතුය. වගාවේ පුෂ්ප හට ගන්නා විට ජලය සැපයීම ඉතා වැදගත් වේ.

**වල් පැලෑටි පාලනය**

සිටුවා සති 3ක දී හා 6ක දී අතින් වල් මර්ධනය කිරීම කළ හැකිය. ඉන් පසු, අවශ්‍යතාවය අනුව වල් මර්ධන කටයුතු කළ හැකිය. වගාව මුල් අවධියේම පූර්ව වල් නාශකයක් යොදා නැවත සති 6කින් පසු වල් මර්ධනය අතින් කිරීම ද කළ හැකිය.

**කෘමි හා රෝග පාලනය**

**පත්‍ර පුල්ලි රෝගය** - රටකජු වගාවේ පත්‍ර මත දුඹුරු පාට පුල්ලි ඇති වී, පත්‍ර උඩ පැත්තේ වඩාත් තදට මෙම පුල්ලි දක්නට ලැබේ. බීජානු පත්‍රයේ උඩ පැත්තේ දක්නට ඇත.

**පාදස්ථ කුණුවීම** - කඳේ පාදස්ථය කුණුවීම හා සෙසු ප්‍රදේශ දුඹුරු පාට වීම සුදු පාට දිලීර ජාලා කඳ පාමුල හා මුල් මත දිස්වීම සිදුවන අතර ශාකය කහ පාට වී මිය යෑම සිදු වේ.

**මලකඩ රෝගය** - පත්‍රය ක්‍රමයෙන් වියැළී ගොස් ගස මිය යෑම සිදු වේ. පත්‍ර වල යටි පැත්තේ තැඹිලි පාට බුබුළු ඇති වේ. මේවා පිපිරී රතු දුඹුරු බීජානු දක්නට ලැබේ.

**අංකුර මිය යෑම** - හරිත පැහැ වූ ලප පත්‍ර මත දිස්වීම හා ක්‍රමයෙන් මිය යෑම සිදු වේ. කඳේ අග්‍රස්ථ අංකුරවල මිය යෑමක් දක්නට ලැබේ. ශාක කුරුවීම පත්‍ර විචිත්‍ර හා පත්‍ර විකෘති වීම සිදු වේ.

**සදත් අංගමාරය** - අක්‍රමවත් දුඹුරු පුල්ලි පත්‍ර වල ඇති වේ. පත්‍ර මැල වී පත්‍ර පතනය සිදු වේ. රෝගී පත්‍ර වල ලප වල යට පැත්තේ දිලීර බීජානු දක්නට ලැබේ.

**සියළු රෝග පාලනයට අනුගමනය කළ යුතු වත් පිළිවෙත්**

- ප්‍රතිරෝධී ප්‍රභේද වගා කිරීම.
- රෝගී ශාක ක්ෂේත්‍රයෙන් ඉවත් කිරීම.
- වල් පැලෑටි ක්‍රමානුකූලව පාලනය කිරීම.
- භෝග මාරුව.
- හානිය වැඩිපුර දක්නට ඇත්නම් දිලීර නාශකයක් නිෂ්පාදකයාගේ උපදෙස් මත යෙදීම.

**කෘමි හානි**

i. **රතු කෙඳි දළඹුවා**

මෙම දළඹුවා නිසා පත්‍ර පතනය වීම සිදු වන අතර දළඹුවා වගාවේ ඇත්නම් පියවි ඇසට දක්නට ලැබේ.

ii. **පත්‍ර කනින්නා**

පත්‍ර මත රිදී පැහැති අක්‍රමවත් ඉරි දක්නට ලැබේ.

**කෘමි පාලනය**

- දළඹුවන් හා බිත්තර කැබලි විනාශ කර දැමීම.
- හානිය වැඩි නම් නිර්දේශිත කෘමි නාශකයක් යෙදීම කරන්න.

**අස්වනු නෙළීම**

රටකජු වගාවේ පත්‍ර කහ පාට වී මිය යෑම සිදු වේ. දින ගණන ප්‍රභේදය අනුව වෙනස් වේ. ස්ථාන කිහිපයක රටකජු පඳුරු ගලවා රටකජු බීජ මෝරා ඇත්දැයි පරීක්ෂා කර බලන්න. පසෙන් උදුරා ගන්නා ලද රටකජු බීජ දින 2-3ක් ක්ෂේත්‍රයේම වියළා හරින්න. ඉන්පසු, රටකජු ගස්වලින් බීජ වෙන් කර ගෙන සති 2ක් පමණ සූර්යාලෝකයෙන් වියළා ගන්න. තෙතමනය 10%ක් වන තුරු පොතු සමඟ වියළා ගබඩා කර ගන්න. හොඳින් වාතාශ්‍රය ලැබෙන දල් ගෝනි වල අසුරා ගබඩා කිරීම වැදගත් ය.

# බඩඉරිඟු වගාව

උද්භිද නාමය - සියාමේස්

කුලය - ග්‍රැමිනෝ

**බ**ඩඉරිඟු වගාව ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගොඩ ඉඩම් වල මාස් කන්නයේ වර්ෂා ජලයෙන් බහුලව වගා කරන අතර දෛනික ආහාර වේල් විධිමත් කර ගැනීම සඳහා ගම්බද ජනතාව අතර ඉතා ජනප්‍රිය භෝගයක් වී තිබේ.

බීජ ලබා ගැනීමට වඩා කිරි ඉරිඟු වශයෙන් මෙය ඉතා ජනප්‍රිය වී ඇත.

මෙම භෝගය වර්ෂා ජලයෙන් පෝෂිත වගාවක් ලෙස ගොවීන් අතර ඉතා ජනප්‍රිය අතර වියළි කලාපයේ DL 1, DL 2, DL 3 හා I.M යන කෘෂි දේශගුණික කලාප වල ඇති ගොඩ ඉඩම් වල මහ කන්නයේ දී වර්ෂාපතනය සහ සෙසු දේශගුණික සාධක වගාවට හිතකරව පවතින තත්ත්වයක් යටතේ වගා කළ හැකිය. අවම වශයෙන් ඒකාකාරිව හොඳින් පැතිරුණු මි.මී. 500-600ක් අතර වර්ෂාපතනයක් මහ කන්නය තුළ දී ලැබිය යුතුය. වියළි කාල වල දී, විශේෂයෙන් යල කන්නයේ දී ජල සම්පාදනයෙන් ඉතා සාර්ථකව බඩඉරිඟු වගා කළ හැකිය. එහෙත් පුරුක් පණුවාගේ හානිය යල කන්නයේ ද දක්නට ඇති නිසා ගොවීන් ඒ සඳහා තරමක මැලිකමක් දක්වයි.

වර්තමාන තත්ත්වයන් යටතේ ජල හිඟයට යල කන්නයේ දි පිළියමක් ලෙස, වී වගාව වෙනුවට බඩඉරිඟු වගාව තෝරා ගැනීම ඉතාම කාලෝචිතය.

## පාංශු අවශ්‍යතාවයන්

බඩඉරිඟු වගාව සඳහා හොඳින් ජලය වහනය වන ගැඹුරු පසක් අවශ්‍ය වේ. දුර්වල ජල වහනය සහිත ඉඩම්වල බඩඉරිඟු වගා කළ විට වර්ධනය බාලවීම හා පත්‍ර කහ පාට වීම සිදු වේ. මෙම වගාව සඳහා ඉතාමත් හොඳ පසෙහි pH අගය 5.3-6.0 දක්වා වූ පරාසයක පැවතිය යුතුය.

## බිම් සැකසීම

බඩඉරිඟු වගාව සඳහා බිම් සැකසීමේ දී සෙ.මී. 15-25ත් ගැඹුරට බිම් සැකසීම කළ යුතුය. පසුව, කැට පොඩි කර පස සියුම්ව සකස් කර ගත යුතුය. අධික ලෙස වල් පැළෑටි සහිත ඉඩම් වල වල් පැළෑටි විනාශ කිරීම සඳහා දෙවරක් සී සෑම අවශ්‍ය වේ.

## බීජ අවශ්‍යතාවය

හෙක්. 1ක් වගා කිරීම සඳහා බඩඉරිඟු කි.ග්‍රෑ. 16-20ක් පමණ අවශ්‍ය වේ.

## සිටුවන කාලය

**මහ කන්නය** - සැප්තැම්බර් මස අග සිට ඔක්තෝබර් මස මුල් කාලය තුළ බීජ සිටුවීම කළ යුතුය. බීජ සිටුවන කාලය ඉතාමත් වැදගත් වන අතර ප්‍රමාද වී සිටුවීම කළ විට භෝගයේ වර්ධනය බාල වන අතර ජලය හිඟවීම නිසා වගාව අසාර්ථක වීමට ඉඩ තිබේ.

**යල කන්නය** - මාර්තු මස අග සිට අප්‍රේල් මස මුල් කාලය තුළ පළමු වර්ෂාවත් සමඟ බීජ සිටුවීම කළ යුතුය.

## බීජ සිටුවන පරතරය

සෙ.මී. 2-3ත් ගැඹුරට බීජ අතින් හෝ වප්කරය මඟින් එක ස්ථානයක බීජ 2-3ක් බැගින් සිටුවීම කළ යුතුය. යල කන්නයේ නම් ජල සම්පාදනය කිරීමට හැකි වන සේ වැටි හා කාණු ක්‍රමයට බිම් සකස් කර බීජ සිටුවීම ඉතා වැදගත් ය. ප්‍රභේදය, පාංශු තෙතමනය, පසේ ඇති පෝෂක ආදී කරුණු මත ප්‍රශස්ථ පැළ ගහනය තීරණය වේ.

ප්‍රශස්ථ මට්ටමට පාංශු තෙතමනය සහ පොහොර යොදන විට ධාන්‍ය බීජ ලබා ගැනීමට නම් දියුණු ප්‍රභේද (භද්‍රා 1 වැනි) වගා කිරීමෙන් එනම්, හෙක්. 01කට පැළ 55,000 ක් ලැබෙන සේ සෙ.මී. 60×30

| නිර්දේශිත ප්‍රභේද | වයස දින | අස්වැන්න හෙ./කි.ග්‍රෑ. | බීජවල ස්වභාවය |
|---|---|---|---|
| හද්‍රා | 105-115 | 4,500 | තැඹිලි පාට |
| රුවනි | 110-115 | 4,000 | රන්වන් තැඹිලි පාට |
| මුතු | 110-115 | 4,000 | සුදු පාට |
| අරුණ | 90-100 | 3,000/3,500 | තැඹිලි සහ කහ පාට |




පරතරයට එක වලක එක් පැළයක් බැගින් ද, සෙ.මී. 60×60 පරතරය සඳහා එක වලක පැළ දෙකක් වන සේ ද බීජ සිටුවීම කළ යුතුය. වැඩි පැළ ඇත්නම් පැළ වී සති දෙකක දී ගලවා ඉවත් කළ යුතුය. අඩු පොහොර මට්ටම් වල දී හා නො මේරූ කරල් (කිරි ඉරිඟු) ලබා ගැනීමට වගා කරන විට දී, උසට වැඩෙන වැඩි පත්‍ර ප්‍රමාණයක් ඇති දේශීය ප්‍රභේදයන් හි ඇද වැටීම හා දුර්වල කරල් වර්ධනය අඩු කර ගැනීම සඳහා හෙක්. 01කට පැළ 30,000 වන සේ පැළ ඝනනය පවත්වා ගත යුතුය. මේ සඳහා සෙ.මී. 60×45 පරතරයට එක වලක පැළ 01ක් ඉතිරි කර, වගාවට සති දෙකේ දී වැඩි පැළ ගලවා ඉවත් කළ යුතුය.

**පොහොර යෙදීම**

ඉතා හොඳ භෝග පාලනයක් හා හොඳ අස්වැන්නක් සඳහා,

නයිට්‍රජන් හෙක්. 01කට කි.ග්‍රෑ. 65ක්,
සුපර් ෆොස්පේට් හෙක්. 01කට කි.ග්‍රෑ 45 ක්,
මියුරියේට් ඔෆ් පොටෑෂ් හෙක්. 01කට කි.ග්‍රෑ. 30ක්

යනා දී වශයෙන් සැපයීම කළ යුතුය. බඩඉරිඟු සිටුවීමට පෙර මූලික පොහොර භාවිතා කිරීම ඉතා වැදගත් වේ.

**මූලික පොහොර**

යූරියා කි.ග්‍රෑ. 50ක් හෙක්. 01කට,
සුපර් පොස්පේට් කි.ග්‍රෑ. 100 හෙක්. 01කට,
මියුරියේට් ඔෆ් පොටෑෂ් කි.ග්‍රෑ. 50 හෙක්. 01කට

යෙදීම කළ යුතු වේ.

**මතුපිට පොහොර යෙදීම**

පැල සිටුවා සති 04කට පසු හෙක්ටයාරයකට යූරියා කි.ග්‍රෑ. 100 වන සේ යෙදීම කළ යුතු වේ.

**ජල සම්පාදනය**

මහ කන්නයේ වර්ෂාවෙන් වගාවට අවශ්‍ය ජලය ලබා ගත හැකි වේ. වියළි කලාපයේ යල කන්නයේ සාර්ථක වගාවක් සඳහා ජල සම්පාදනය කිරීම වැදගත් වූවකි. ජල සම්පාදනය කරන විට සෙ.මී. 20ක් ගැඹුරට පස තෙත් කිරීම අවශ්‍ය ය. භෝගය දණිස් මට්ටම දක්වා වැඩෙන තෙක් දින

04කට වරක් ජල සම්පාදනය කළ යුතුය. ඉන් පසු, අස්වනු නෙළීමට සති 02 කට පෙර අවස්ථාව දක්වා දින 05 - 06කට වරක් ජලය සම්පාදනය කිරීම අත්‍යාවශ්‍ය වේ.

**රසායනික වල් මර්ධනය**

මෙහි දී, පහත සඳහන් වල් නාශක වර්ග යොදා ගත හැකිය.

- ඇලක්ලෝර් කි.ග්‍රෑ. 1.5-2.0 දක්වා (හෙක්ටයාරයකට)
- ලිනියුරෝන් කි.ග්‍රෑ. 0.8-1.2 දක්වා (හෙක්ටයාරයකට)
- ඔක්සිප්ලුඩන්සර් කි.ග්‍රෑ. 0.12-0.18 දක්වා (හෙක්ටයාරයකට)

සෝයා බෝංචි, උඳු, මුං, රනිල භෝග ඇතුළත් වන සේ අතුරු භෝග වගාවක් ලෙස බඩඉරිඟු වගාව කරන විට රසායනික වල් මර්ධනය සඳහා පහත සඳහන් වල් නාශක විශේෂයෙන් නිර්දේශ කෙරේ.

i. ඇලක්ලෝර්
ii. ඔක්සිප්ලුඩන්සර්

**රෝග පාලනය**

- **පත්‍ර පුල්ලි රෝගය**

- හෙල්මින්තස් ඒරෝරියම් විශේෂයයි.

**රෝග ලක්‍ෂණ**

* පත්‍ර ධාරය රතු පැහැයක් ගනී.
* පත්‍ර මත දිගටි පුල්ලි ඇති වේ.
* කරල් කුණු වීම සිදු වේ.

මේ සඳහා නිෂ්පාදකයාගේ උපදෙස් පරිදි දිලීර නාශකයක් යෙදීම නිර්දේශ කෙරේ.

- **පත්‍ර හා කොපු කුණුවීම පුල්ලි රෝගය**

- රයිසොප් ටෝනියා විශේෂයකි.

**රෝග ලක්‍ෂණ**

දිගටි අණ්ඩාකාර අලුවන් කොළ පාට පුල්ලි ඇති වී සම්පූර්ණ පත්‍ර හා කොපුව වසාගෙන වර්ධනය වීම සිදු වේ. මෙම රෝගය පාලනය කිරීම සඳහා හැකි සෑම විටම වසුනක් යෙදීම කරන්න.

- **නටු කුණු වීම**

- ඩිප්ලෝඩියා විශේෂයකි.

**රෝග ලක්‍ෂණ**

ආසාදිත නටු දුඹුරු වර්ණයට හැරී තිත් හා මෘදුවීම සිදු වේ.

**රෝග පාලනය**

- ජල වහනය දියුණු කිරීම.
- බීජ ප්‍රතිකාර කිරීම.
- විශාල වශයෙන් ඇත්නම් දිලීර නාශකයක් යෙදීම.

- **කරල් කුණු වීම**

- පියුසේරියම් විශේෂයකි.

**රෝග ලක්‍ෂණ**

අණ්ඩාකාර අළු පැහැති රේඛා බීජවල දකිය හැකිය. මෙම අණ්ඩාකාර පැල්ලම් සාමාන්‍ය කරලක මෙන් නොපිහිටා එකිනෙකට ඇතින් පිහිටා තිබේ. දිලීර නාශක යෙදීම අවශ්‍ය නොවේ.

වර්තමාන තත්ත්වයන් යටතේ කිරි ඉරිඟු කරලක මිල රු : 10/-ක් වන අතර හෙක්ටයාරයකින් ලබා ගත හැකි කරල් සංඛ්‍යාව ගැන සැලකීමේ දී එය 50,000ක් පමණ වේ. මේ අනුව, ආන්තික කුඹුරු ඉඩම් වල බඩඉරිඟු වගා කිරීමෙන් ඉතා හොඳ ආදායමක් වියළි කලාපයේ ගොවීන් හට ලබා ගත හැකිය.

**පසු අස්වනු කටයුතු**

* ආවරණය ඉවත් නොකරන ලද බඩඉරිඟු කරල් ගබඩා කිරීමට පෙර ඒවායේ තෙතමනය 25% හා 35% සිට 13% හා 14% දක්වා අඩු කිරීමට හිරු එළියේ වියැළීම කළ යුතුය.
* කරල් නිතර පරීක්‍ෂා කර රෝග ආසාදිත ඒවා ඉවත් කළ යුතුය.
* මීයන් ගබඩා වලට ඇතුල්වීම වැළැක්වීම සඳහා අවශ්‍ය විධිවිධාන සකස් කර ගත යුතුය.

**ඩබ්.ඒ. අමරසේන වික්‍රමසිංහ මහතා**
විෂයානුබද්ධ නිලධාරි (පැලෑටි සංරක්ෂණය)
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති) කාර්යාලය,
අම්පාර.